# හින්දී භාෂාවේ අනුනාසිකය සහ සිංහලයේ සඤ්ඤකය

*කමලවීර, පී. නර්මදා තිලංකා* [1]

හින්දී භාෂාවේ '**අනුනාසිකය**' සංකේතවත් කෙරෙන්නේ '**චන්ද්‍ර බින්දුව**' මගිනි. මෙම අනුනාසිකය සිංහලයේ ඇති සඤ්ඤක ශබ්දය හා සමාන වේ. එහෙයින් හින්දී භාෂාවේ අනුනාසිකය හා සඤ්ඤකය අතර කිසියම් හෝ සමාන බවක් තිබෙන්නේද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මේ සඳහා පුස්තකාල භාවිතය පර්යේෂණ ක්‍රමවේදය ලෙසින් යොදා ගැනුණු අතර සංස්කෘත, හින්දී සහ සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත කර ඇත. සිංහල සඤ්ඤකයේ සහ හින්දී අනුනාසික උච්චාරණය සමාන වුවද සඤ්ඤකය භාවිත වන්නේ ඟ, ඦ, ඬ, ඳ, ඹ යන අක්ෂර පහ සමඟ පමණි. එහෙත් මෙම අක්ෂර පහට අමතරව වෙනත් අක්ෂර සඳහාද සඤ්ඤකය භාවිත වේ. එහෙත් එම අක්ෂර බහුල ලෙස භාවිතයේ නොපවතියි. අනුනාසිකය හින්දී භාෂාවේ බොහෝ ස්වර සමඟ භාවිත වේ. එසේම හින්දී භාෂාවේ චන්ද්‍ර බින්දුව අනුනාසිකයක් ලෙස හඳුන්වා ඇත. එම ශබ්දය සිංහලයේ හැඳින්වෙන්නේ අර්ධ අනුනාසිකය යනුවෙනි. එසේම සිංහලයේ අනුනාසික යනු, ඞ, ඤ, ණ, න, ම, යන අක්ෂර පහ වේ. හින්දී භාෂාවේ ශිරෝරේඛාවට ඉහළින් ස්වර පිල්ලමක් නොමැති අක්ෂර අනුනාසිකව දැක්වීමට '**චන්ද්‍ර බින්දී**' නම් සංකේතය භාවිත කරන අතර, ශිරෝරේඛාවට ඉහළින් ස්වර පිල්ලමක් යෙදෙන අක්ෂර අනුනාසිකීකරණයට '**බින්දී**' නම් සංකේතය භාවිත වේ. මෙලෙස හින්දියේ අනුනාසික සංකේත දෙකක් නිරූපණය වුවද සිංහලයේ සඤ්ඤකය සඳහා '**වක් ඉත්තක්**' වැනි එකම සංකේතයක් පමණක් භාවිත වේ. තවද හින්දී භාෂාවේ භාවිත අනුනාසික ශබ්දය සිංහලයේද භාවිත වන ඇතැම් අවස්ථා ඇත. මෙම කරුණු අධ්‍යයනය කිරීමෙන් සංස්කෘත භාෂාවෙන් හින්දී භාෂාවට පැමිණි අනුනාසිකය, හින්දී භාෂාවට සුවිශේෂ වූ ලක්ෂණ ප්‍රකට කරන අතර, සඤ්ඤකය සිංහල භාෂාවේ අනන්‍යතාව නිරූපණය කරන බවද නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද**: හින්දී භාෂාව, චන්ද්‍ර බින්දුව, අනුනාසිකය, භාෂා අනන්‍යතාව, සඤ්ඤකය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*thilankakamalaweera@gmail.com*